**හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**

**--------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**

**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

**--------------------------------**

**සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 09 දින ද සභාවේ, සභාපතිවරයාට යවා ඇත.**

**1.2 මතය.**

**------------**

**මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**-----------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.**

**-------------------------**

**පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ) සමාලෝචිත වර්ෂයේ රු.95,216 ක් වැය කර, ඉදි කරන ලද යටි/ උඩගම බහු කාර්යය ගොඩනැගිල්ල හී වටිනාකම ප්‍රාග්ධනිත නොකිරීම**

හේතුවෙන්, ගොඩනැගිලි ගිණුම සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ රු.309,000 ක කසළ බදු ආදායම් රු.321,000 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන්, කසළ බදු ආදායම් රු.12,000 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

**1.3.2** ලැබියයුතු ගිණුම් හා ගෙවියයුතු ගිණුම්.

------------------------------------------

(අ) ලැබියයුතු ගිණුම්.

--------------------

**2013** දෙසැම්බර් **31** දිනට ලැබියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.**15,013,408** ක් වු අතර, එයින් අවුරුදු **01** ක කාලයක් ඉක්මවා තිබුණු ගිණුම් ශේෂයන් හී එකතුව රු.**1,731,532** ක් වී තිබුණි.

(ආ) ගෙවියයුතු ගිණුම්.

-----------------------

**2013** දෙසැම්බර් **31** දිනට එකතුව රු.**9,183,412** ක් වු ගෙවියයුතු ගිණුම් ශේෂවලින් අවුරුදු **01** ක කාලයක් ඉක්මවා තිබු ශේෂයන්ගේ එකතු වටිනාකම රු.**1,323,780** ක් වී තිබුණි.

**2.** මූල්‍ය සමාලෝචනය
-------------------------

**2.1** මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, **2013** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.**14,307,986** ක් වු අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.**18,282,595** ක් වුයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.**3,974,609** ක පිරිහීමක් දක්නට ලැබුණි.

**2.2** විග්‍රාහත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

සමාලෝචිත වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණ වශයෙන් රු. **14,656,123** ක් ලැබී තිබුණු නමුත්, වැටුප් හා දීමනා ලෙස රු. **19,080,657** ක් ගෙවා තිබුණි. ඒ අනුව, සභාවේ ආදායමෙන් රු.**4,424,534** ක මුදලක් සභා සේවකයින් සඳහා වැටුප් ගෙවීමට වැයකර තිබුණි. එම මුදල් වැටුප් ප්‍රතිපූර්ණය හැර සභාවේ පුනරාවර්තන ආදායමින් සියයට **14.34** ක් වී තිබුණි.

**2.3** කාරක ප්‍රාග්ධන කළමනාකරණය

------------------------------------

මුළු ජංගම වත්කම් සමග ජංගම වගකීම් දැක්වෙන අනුපාතය **3.35:1** වූ අතර, ඉකුත් වර්ෂයේ අනුපාතය වූ **2.58:1** ප්‍රශස්ථ මට්ටමක පැවතින. තව ද, සමස්ත ජංගම වත්කම්වලින් සියයට **43** ක් හෙවත්, මිලියන **15** ක් කර්මාන්ත හා විවිධ ණයගැතියන් වූ අතර, මුළු ජංගම වගකීම්වලින් සියයට **89** ක් හෙවත්, මිලියන **9.1** ක් කර්මාන්ත හා විවිධ ණයහිමියන්ගෙන් සමන්විත වී තිබුණි.

**2.4** ආදායම් පරිපාලනය

-----------------------

**2.4.1** සම්ප්‍රේෂණ කුළුණු ව්‍යාපාර බදු

---------------------------------

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සම්ප්‍රේෂණ කුළුණ **18** ක් ස්ථානගත කර තිබූ අතර, එම කුළුණුවලින් ව්‍යාපාර බදු අය කර නොතිබීම හේතුවෙන්, සභාවට **2013** වර්ෂයේ දි රු.**13,200** ක මුදලක් අහිමි වී තිබුණි.

**2.4.2** මුද්දර ගාස්තු.

---------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් **2013** දෙසැම්බර් **31** දිනට ලැබිය යුතුව තිබුණු මුද්දර ගාස්තුවල වටිනාකම

**රු.3,000,000 ක් විය. එයින්, 2014 ජූලි 14 දිනට රු.800,972 ක් තවදුරටත් ලැබියයුතුව තිබුණි.**

**2.4.3 පරිසර බලපත්‍ර ගාස්තු**

**------------------------**

**1988 අංක 56 සහ 2000 අංක 53 දරණ පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරණ අති විශේෂ ගැසට් නිවේදනය අනුව ව්‍යාපෘති 06 ක පරිසර බලපත්‍ර ලබා නොගැනීම හේතුවෙන්, රු.46,200 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.**

**3. මෙහෙයුම් සමාලෝචනය.**

**-------------------------------**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා.**

**---------------------------------------**

**මැදවල, දෙඹරලාව මාර්ගයේ අක්කර 04 කට ආසන්න ඉඩමක් සභා අනුමැතියකින් තොරව කොටස් කර, එයින් කොටස් 02 ක් විකුණා තිබුණු අතර, මෙම ඉඩමේ වම් පැත්තට මීටර් 20 ක පමණ පැති බැම්මක් ද, දකුණු පැත්තට මාර්ග 02 ක් ද අනවසරයෙන් ඉදි කර තිබුණ නමුත්, මෙම සභාව අනවසර ඉදි කිරීම් හා අනවසරයෙන් ඉඩම් අළෙවි ව්‍යාපාරයක් පවත්වා ගෙන යාම් පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.**

**3.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

**--------------------------------------**

**සමාලෝචිත වර්ෂය අවසානයට රු.312,028 ක වටිනාකමක් වූ වත්කම් විෂයයන් 04 ක් අවුරුදු 03 කට වැඩි කාල සීමාවක සිට නිෂ්ක්‍රීයව හා ඌණ උපයෝජිතව පැවතින.**

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය.

--------------------------

අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ගල් ඇතිරීම සම්බන්ධව පිළියෙළ කළ ඇස්තමේන්තුවේ වැඩ විෂයය අංක 2.2 ඡේදය යටතේ කොන්ක්‍රීට් පැති බැමි අගල් 9 ක උසකින් ඉදි කිරීමට ඇස්තමේන්තු කර ගිවිසුම්වලට එළඹ ඇතත්, පරීක්ෂාවට භාජනය වූ කර්මාන්ත 07 ක කොන්ක්‍රීට් පැති බැමි අගල් 4 ක සාමාන්‍ය උසකින් එම ඇස්තමේන්තුගත ප්‍රමිතියට පටහැනිව ඉදි කර, එම ප්‍රමාණයට ගෙවීම් කර තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

--------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේ දි ආදායම් විෂයයන් 06 ක සියයට 13 සිට සියයට 57 දක්වා ද, වියදම් විෂයයන් 07 ක සියයට 9 සිට සියයට 100 ක් දක්වා ද, විචලනයන් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය.

(ආ) ආදායම්පරිපාලනය.

(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය.